// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1871/20 - 2014 ජූලි මස 15 වැනි අඟහරුවාදා - 2014.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/13/26/2008.

**කාර්මික ආරවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.11.10 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ පාදුක්ක, මලගල, අංක 167හි එන්. පී. බාලසූරිය/බුලත්සිංහල, ඇගල්ඔය, පොල්ගහකන්ද හි ආර්. ඒ. ඩී. නිහාල්/පොකුණුවිට, කනේවෙල, ශාන්ති වත්ත හි එච්. ඒ. ජගත්චන්ද්‍ර සහ කොළඹ 05, කිරුල පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3358 දරන ප්‍රදානය 2013.09.06 දිනැති හා අංක 1826/38 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2014.05.26 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැ. බ. කම්කරු කොමසාරිස්.*

2014 ජුනි මස 26 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

බේරුම්කරණ නඩු
අංක ඒ-3358

1) එන්. පී. බාලසූරිය,
අංක 167, මලගල,
පාදුක්ක.

2) ආර්. ඒ. ඩී. නිහාල්,
පොල්ගහකන්ද,
ඇගල්ඔය,
බුලත්සිංහල.

3) එච්. ඒ. ජගත්චන්ද්‍ර,
ශාන්ති වත්ත,
කනේවෙල,
පොකුණුවිට.

ඉල්ලුම්කරුවන්

-එදිරිව-

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත පාර්ශ්වයන් සම්බන්ධයෙන් ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.09.06 දී *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වී ඇත. ප්‍රමාද දෝෂයකින් එකී ප්‍රදානය ක්‍රියාත්මක කළ යුතු දිනය සඳහන්ව නැත.

එසේ හෙයින් උක්ත ප්‍රදානය මෙම නිවැරදි කිරීම *ගැසට් පත්‍රයේ* පළවී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු බැව් නිගමනය කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2014 මැයි මස 26 වැනි දින.

08-74

---

*මගේ අංකය* : IR/13/10/2011.

**කාර්මික ආරවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.03.19 දිනැති හා අංක 1750/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.02.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙලිඅත්ත, ගැටමාන්න, "ගුරු කැළුම්" හි පදිංචි ඩී. ජී. ගුණදාස හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.05.07 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැ. බ.* කම්කරු කොමසාරිස්.

2014 ජූනි මස 26 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/13/10/2011.

**කාර්මික අධිකරණයේ දී ය**

ඩී. ජී. ගුණදාස,
"ගුරු කැළුම්",
ගැටමාන්න,
බෙලිඅත්ත.

නඩු අංකය :
ඒ/3446

ඉල්ලුම්කරු

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

**ප්‍රදානය**

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය "1956 ප්‍රතිශෝධන මුද්‍රණය" වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2012.02.28 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

මෙම නඩුවේ කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වන්නේ පළමු පක්ෂය වන ඩී. ජී. ගුණදාස නමැති අය, දෙවන පක්ෂය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහකාර කළමනාකාර මුදල් තනතුරේ සේවය කරමින් සිටියදී, අධිකරණයට කළ ගෙවීමක් සම්බන්ධයෙන් 2011 මාර්තු 16 දිනැතිව ආයතනය නිකුත් කර ඇති නියෝගය පරිදි ඔහුට ලබා දී ඇති දඬුවම සාධාරණ ද යන්නත්, එසේ නොවන්නේ නම් කුමන සහනයක් හිමි විය යුතු ද යන්නත්, සම්බන්ධවයි.

දෙපාර්ශවය විසින්ම තම තමන්ගේ පළමු ප්‍රකාශය හා දෙවන ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විමසීම සඳහා නියම කර ඇත.

පළමු පාර්ශ්වය පෙනී සිටි අතර, ඔහු වෙනුවෙන් නියෝජිත ඒ. ඩී. වික්‍රමසිංහ මහතා පෙනී සිටින ලද අතර, දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් නීති නිලධාරිනී නිමාෂා අයන්ති මෙනෙවියගේ උපදෙස් මත පළමුව රජයේ නීතිඥ රොසාලි ප්‍රනාන්දු මහත්මිය ද දෙවනුව රජයේ නීතිඥ දිස්නා ප්‍රනාන්දු මහත්මිය ද පෙනී සිටි ඇත.

දෙපාර්ශ්වය විසින්ම සාක්ෂි ඉදිරිපත් කරන ලද අතර, පළමු පාර්ශ්වය පැ/01 සිට පැ/12 දක්වා ලේඛන ලකුණු කරමින් ද, දෙවන පාර්ශ්වය R/01 සිට R/07 දක්වා ලේඛන ලකුණු කරමින් ද නඩුව අවසන් කරන ලද අතර, දෙපාර්ශ්වය විසින්ම ලිඛිත දේශන ද ගොනු කර ඇත. සියළුම සාක්ෂි ලේඛන හා ලිඛිත දේශන ද මා විසින් පරීක්ෂා කර බලන ලදී.

ආරවුලට හේතු වී ඇති සිද්ධිමය කරුණ නම්, අම්බලන්තොට ඩිපෝවේ සහකාර කළමනාකාර මුදල් තනතුරේ සේවය කරන ලද පළමු පාර්ශ්වය වන ඩී. ජී. ගුණදාස යන අය ආයතනය විසින් ගෙවිය යුතු අර්ථ සාධක මුදල් ගෙවීම පිණිස අධිකරණයෙන් කරන ලද නියෝගය මත මහේස්ත්‍රාත් අධිකරණයේ තැන්පත් කිරීම සඳහා රු. 50,000ක මුදලක් ආයතනයේ පවතින පිළිවෙලට පටහැනිව මාර්ග ලේඛන ආදායමින් ලබා ගෙන ඇතැයි යන්න බව පැහැදිලි වේ.

දෙවන පාර්ශවය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ස්ථාවරය වන්නේ අධිකරණයේ තැන්පත් කිරීම සඳහා ආයතනයේ ක්‍රියා පිළිවෙලට පටහැනිව, ඩිපෝ කළමනාකාර තැනගේ අනුමැතියකින් තොරව, මෙම මුදල් ලබා ගෙන ඇති බවයි. ඒ අනුව ඩිපෝ කළමනාකාර තැනගේ අනුමැතියකින් තොරව මණ්ඩලීය පිළිවෙත්වලට පටහැනිව රු. 50,000ක මුදලක් ලබා ගැනීම හා ඩිපෝ කළමනාකර දැනුවත් නොකිරීමෙන් තම තරාතිරම ඉක්මවා

කටයුතු කිරීම සම්බන්ධයෙන් චෝදනා කර පරීක්ෂණයක් පවත්වා මාස 01ක සේවය තාවකාලිකව අත්හිටුවීම සහ සහකාර කළමනාකරු (මුදල්) තනතුරෙන් ඉවත් කිරීම යන දඬුවම් ලබා දී ඇති බවයි. ඒ සම්බන්ධව විනය පරීක්ෂණයක් පවත්වා, පළමු පාර්ශ්වයට ආයතනය විසින් දඬුවම් ලබා දීම හේතුවෙන්, එයින් අසන්තෝෂයට පත් පළමු පාර්ශ්වය විසින් සහන පතා මෙම ඉල්ලීම කර ඇත.

දැන් මෙම ආරවුලට අදාල වූ සිද්ධිමය තත්ත්වය හා දෙපාර්ශ්වයම පිළිගත් කරුණු පිළිබඳ විස්තරාත්මකව සලකා බලමු.

අර්ථ සාධක අරමුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලද බවත්, අධිකරණයට පැමිණෙන ලෙස ඩිපෝ කළමනාකාරවරයා වෙත ලැබුණු සිතාසිය අනුව බලය පැවරීමේ ලිපියක් ලබා දෙමින් ඩිපෝ කළමනාකාර ගාමිණි ප්‍රනාන්දු විසින් මෙම නඩුවේ පළමු පාර්ශ්වය වන ඩී. ජී. ගුණදාස යන අය ආයතනය වෙනුවෙන් අධිකරණයට යවන ලද බවත්, අර්ථ සාධක අරමුදල ලෙස රු. 2,35,206.50 පමණ මුදලක් නොගෙවීම සම්බන්ධයෙන් ආයතනය නියෝජනය කරන ලද පළමු පාර්ශ්වය අධිකරණ සිර කූඩුවේ රඳවා තබන ලද බවත්, පසුව එකී මුදල රු. 50,000ක වාරික මගින් ගෙවීමට නියම කර ඔහු ඇප මත මුදා හැර ඇති බවත්, ඇප සඳහා ආයතනයේ සේවකයකු වන ධාවන කළමණාකාර ආරියදාස යන අය අත්සන් කර ඇති බවත්, එම මුදල ගෙවීම සඳහා අධිකරණය විසින් දිනයක් නියම කර ඇති බවත්, පිලිගෙන ඇත. එදින පළමු පාර්ශ්වය විසින් වවුචරයක් සකස් කර ඉහත කී ආරියසේන නමින් වැය සහතික කර දෛනික ආදායම් මුදල් ගිණුමෙන් රු. 1,00,000 මුදලක් ලබාගෙන එයින් රු. 50,000ක මුදල එදිනම එනම්, 2009.10.02 වැනි දින අධිකරණයේ තැන්පත් කර ඇත. එසේ ලබා ගැනීමට සිදු වී ඇත්තේ ඩිපෝ කළමනාකරු සේවා ස්ථානයෙන් බැහැරව ගොස් ඇති නිසාය.

මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර සේවකට එරෙහිව පැමිණිලි කර ඇත්තේ ඩිපෝ කළමනාකාරවරයාය. අධිකරණයේ පෙනී සිටීමට ඩිපෝ කළමනාකාරවරයාට ලැබුණු සිතාසිය අනුව උසාවි ලිපිකරු උපාලි යන අය නොමැති නිසා එදින පළමු පාර්ශ්වයට අධිකරණයේ පෙනී සිටීම සඳහා ලිපියකින් තම බලය පැවරූ බවත්, මුදල් ගෙවීම පැහැර හැරීම මත ආයතනය නියෝජනය කල පළමු පාර්ශ්වය වන ඩී. ජී. ගුණදාස යන අය උසාවි සිර කුටියේ සිරකර තැබූ බවත්, ඔහු ඇප පිට නිදහස් කරන ලද බවත්. රු. 50,000ක වාරික මගින් ගෙවීමට නියම වී ඇති බවත්, ඒ සඳහා ඇප අත්සන් කරන ලද්දේ ධාවන කළමනාකාර ආරියසේන යන සේවක බවත්, ලබා ගන්නා ලද රු. 50,000 එදිනම අධිකරණයේ තැන්පත් කරන ලද බවත්, මුදල් ලබා ගැනීම සඳහා ඇති අන්තිම දිනය එදින බවත්, ඩිපෝ කළමනාකාර ගාමිණී ඉතා හොඳින් දැන ගෙන සිටි බවත්, ඔහුගේ සාක්ෂියෙන් තහවුරු වී ඇත. එමෙන්ම මෙසේ මුදල් ගෙවීම තුළින් ඔහුට ද සහනයක් වී ඇති බවත්, වවුචරය අංග සම්පූර්ණ ලෙස සකසා ඇති බවද පිළිගන්නා ලද අතර, එසේ ගෙවීමට නොහැකි වූයේ නම් සභාපතිතුමාද දෝෂ දර්ශනයට ලක්වන බවද තමා දන්නා බව ප්‍රකාශ කර ඇත. තවද කිසිදු මුදල් වංචාවක් සිදු වී නැති බවද ඩිපෝ කළමනාකරුගේ සාක්ෂියෙන් පිළිගෙන ඇත. චෝදනාව වන්නේ ඩිපෝ කළමනාකරු වන ඔහුගේ අනුමැතියකින් තොරව ආයතනයේ පවතින පිළිවෙතට පටහැනි ආකාරයට මුදල් ලබා ගත් බවට කරනු ලබන චෝදනාවයි.

මුදල් ලබා ගැනීමේ සාමාන්‍ය පිළිවෙතට අනුව මෙම මුදල ලබාගත යුත්තේ උසාවි ලිපිකරු උපාලි යන අය විසින් බවත් ඒ සඳහා ඩිපෝ කළමනාකාර තුමාගේ අනුමැතිය ලබාගත යුතුව ඇති බවත් ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් පෙනී යන අතර, මෙම දිනයේ උසාවි ලිපිකරු පැමිණි නොමැති බවත් සාක්ෂියෙන් හෙළිදරව් වී ඇත. සේවකට ඇති බරපතල චෝදනාව ලෙස පෙනී යන්නේ ඩිපෝ කළමනාකාර තැනගේ අනුමැතියෙන් තොරව මුදල් ලබා ගැනීම හා දෛනික ආදායම් මුදල් මගින් මුදල් ලබා ගැනීමට වුවත්, මෙම මුදල් ගෙවීමේ අවශ්‍යතාවය සම්බන්ධව ඩිපෝ කළමනාකාරතුමා හොඳින් දැන සිටි බව පැහැදිලි වී ඇත.

සියළුම සාක්ෂි සමස්තයක් ලෙස සලකා බැලීමේදී මෙම මුදල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් ඩිපෝ කළමනාකරු ඉතා හොඳින් දැනුවත් වී ඇති අතර, එම මුදල නිසි පරිදි ලබා දීම සඳහා කටයුතු කිරීමේ වගකීම ඔහු සතු වන අතර, ඔහුගේ නියමයෙන් උසස් නිලධාරියාගේ අණට කීකරු වී, ඔහුට ලැබී ඇති සිතාසිය මත ඔහු වෙනුවෙන් අධිකරණයට මෙම නඩුවට ඉදිරිපත් වී ඇති සේවක තැනට අර්ථ සාධක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුව සම්බන්ධව මුහුණ පෑමට වූ ඉහතින් දක්වන ලද සියළු තොරතුරු ඩිපෝ කළමනාකාරවරයා විසින් මැනවින් දැන සිටි බව තහවුරු වී ඇත. ඒ අනුව මෙම මුදල නිසි ආකාරයෙන් නියමිත දිනට අධිකරණයේ තැන්පත් කිරීම සඳහා අදාළ කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ක්‍රියා කිරීම, වගකීම පළමු පාර්ශ්වය වන ඩී. ජී. ගුණදාස යන අය වෙත පමණක් නොව ආයතන ප්‍රධානියා වන ඩිපෝ කළමනාකරවරයා ද සතු වන බව මගේ නිගමනයයි.

මෙම මුදල් නියමිත දිනට ගෙවීම් නොකලේ නම් ඇති වන බරපතල තත්ත්වය ඩිපෝ කළමනාකරවරයාගේ උපදෙස්, නියෝග මත, අධිකරණයේ පෙනී සිටි ඩී. ජී. ගුණදාස නමැත්තා හොඳින් දැන සිටි හෙයින් මෙම මුදල නිසි ආකාරයෙන් කල් වේලා ඇතිව ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනයේ නිසි අවධානය යොමු කරමින් අදාළ කටයුතු කර ගැනීම සඳහා ඔහුට ද වගකීමක් හා යුතු කමක් ඇත. මන්ද මුදල්ගෙවීම සඳහා මාසයකටත් අධික කාලයක් අධිකරණයෙන් ලබා දී ඇත.

ඩිපෝ කළමනාකාරවරයාටත්, ඩී. ජී. ගුණදාස යන පළමු පාර්ශ්වය යන දෙදෙනාම මේ සම්බන්ධයෙන් නිසි අවධානයක් ලබා නොදී නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති බව පැහැදිලි වේ.

පළමු පාර්ශ්වය විසින් මෙම මුදල් ලබා ගැනීම සඳහා අනුගමනය කරන ලද පිළිවෙල ආයතනයේ පවතින පිළිවෙතට පටහැනි බව ඉදිරිපත් කරන ලද සාක්ෂිවලින් පැහැදිලි වී ඇත. කෙසේ වෙතත්, මේ ආකාරයෙන් මුදල් ලබා ගැනීමට හේතු වී ඇති සිද්ධිමය තත්ත්වය සලකා බැලීමේදීත්, මුදල් නියමිත දිනට අධිකරණයේ තැන්පත් නොකලහොත් ආයතනය වෙනුවෙන් අධිකරණයේ පෙනී සිට මුදල් නොගෙවීම මත, ඇප මත මුදා හැර සිටින ඔහුට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතාවය මත ඔහු පත්වන මානසික තත්ත්වය සැලකිල්ලට ගැනීමේදීත්, මෙම මුදල අයුතු ලෙස පරිහරණය කිරීමක් කර නොමැති බව සැලකිල්ලට ගැනිමේදීත්, එදිනම එකී මුදල අධිකරණයේ තැන්පත් කර ඇති හෙයින් ද, අධිකරණයට යෑම සඳහා පත් කර ඇති උසාවි ලිපිකරු උපාලි නමැත්තා පැමිණි නොමැති හෙයිනුත්, ඩිපෝ කළමනාකාරවරයා සේවා ස්ථානයෙන් බැහැරව ගොස් තම වගකීම

නිසි ලෙස ඉටු කිරීමට අපොහොසත් වී ඇති නිසාත්, යන කරුණු සැලකිල්ලට ගැනීමේදී කාර්යාලයේ පවතින පිළිවෙත්වලට පටහැනිව ඩිපෝ කළමනාකාරවරයාගේ අනුමැතියකින් තොරව මුදල් ලබා ගැනීම පිළිබඳව සේවක තැනට ලබා දී අති දඬුවම් ප්‍රමාණය ඉක්මවා යන දඬුවමක් බව මගේ නිගමනයයි.

2006 අංක 03 දරන මුදල් කොට්ඨාශ චක්‍ර ලේඛනයේ දෛනික ආදායම් මුදල් හදිසි අනතුරක් සම්බන්ධයෙන් උසාවි ඇප තැන්පත් කිරීමක් සම්බන්ධයෙන් හැර වෙනත් කිසිදු කාරණයක් සම්බන්ධයෙන් චෙක්පත් මගින් හෝ වවුචරයක් මගින් හෝ මාර්ග ලේඛන ආදායමින් මුදල් ලබා නොගත යුතු බවට සඳහන් කර ඇතත්, එකී චක්‍ර ලේඛනයේම ප්‍රමුඛත්වය ලබා දිය යුතු ගෙවීම් යටතේ අනිකුත් කරුණු අතර සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ත භාර අරමුදල් හා උසාවි නියෝග මත කෙරෙන ගෙවීම් ප්‍රමුඛත්වය ලබා දිය යුතු ගෙවීම් ලෙස සටහන් කර ඇත.

පළමු පක්ෂය මුදල් ලබා ගැනීමේ පිළිවෙත මෙම නඩුවේදී ගැටළු සහගත තත්ත්වයකට පත් කර ගෙන ඇති බව මනාව පැහැදිලි වන අතර, මෙම නඩුවට අදාළ වී ඇති සිද්ධිමය කරුණු විග්‍රහකර බැලීමේදී ඉතාමත් තදින් හා අකුරටම චක්‍ර ලේඛනය හා පිළිවෙත සම්බන්ධයෙන් සලකා බලා සේවක ඩී. ජී. ගුණදාසට එරෙහිව කටයුතු කල යුතුව තිබුණේද යන ප්‍රශ්නය අවධානයට ලක්කල යුතුය.

ඉහත සඳහන් සියළුම කරුණු සමස්තයක් වශයෙන් ගෙන විශ්ලේෂණය කිරීමේදී මෙම සේවක තැනට ලබා දී ඇති දඬුවම අතිශයින්ම ප්‍රමාණය ඉක්මවා යන දඬුවමකි.

විනය නියෝගය පදනම් කර ගෙන ඔහු සහකාර මුදල් තනතුරෙන් ඉවත් කර ඇත. එමෙන්ම ඔහුට මාසික වේතනය වශයෙන් රු. 19,567/- ක මුදලක් ද, සහකාර කළමනාකාර මුදල් වශයෙන් 2011 ජනවාරි මස සිට මසකට ඔහුට හිමිව තිබූ රු. 700/- හා වෘත්තීය දීමනා රු. 300/- සමගින් 2012 අප්‍රේල් මස දක්වා රු. 16,000/- ක මුදලක් අහිමි කර ඇති බවත්, 2011 වසරේ ගෙවන ලද ප්‍රසාද දීමනාව වූ රු. 1,000/-ක් අහිමි වූ බවත්, 2012 වසරේ වැටුප් වර්ධකය මසකට අත්හිටුවන ලද බවත්, ප්‍රකාශ කර ඇත.

ඔහු විසින් ඉල්ලා සිටින්නේ 2012 අප්‍රේල් මස දක්වා අහිමි කල මාසික වේතනය, අහිමි කල දීමනා, වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස රු. 36,567/-ක මුදලක් ද, අත්හිටුවන ලද වේතන වර්ධකය ලබා දෙන ලෙස ද, මණ්ඩලීය අභියාචන නියෝගය නිෂ්ප්‍රභා කරන ලෙස ද, අහිමි කල තනතුර නැවත ලබා දෙන ලෙසද ගාස්තු හා අනිකුත් සහන ලබා දෙන ලෙස යි.

සේවක දැනටමත් වයස පූර්ණත්වය මත විශ්‍රාම ගොස් ඇති හෙයින් නැවත තනතුරෙහි පිහිටුවීමක් පැන නොනගී. මණ්ඩලීය අභියාචනා නියෝගය යුක්තිසහගත නොවන බව මගේ නිගමනයයි. ඒ අනුව සේවකට අහිමි කර ඇති මාසික වැටුප වන රු. 19,567/-ක මුදල ලබා දීම යුක්තිසහගත බවට නිගමනය කරමි. 2011 ජනවාරි මස සිට 2012 අප්‍රේල් මස දක්වා ඔහුට අහිමි කර ඇති රු. 700/- හා රු. 300/- වෘත්තිය දීමනා වශයෙන් රු. 16,000/-ක මුදල ලබා දීම ද යුක්තිසහගත හා සාධාරණ බවට නිගමනය කරමි. ගාස්තු නියම නොකරමි.

ඒ අනුව රු. 35,567/- ක මුදලක් දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයට ගෙවිය යුතු බවට නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද දින සිට දින 30ක් ඉක්ම යාමට ප්‍රථම කොළඹ 05, නාරාහේන්පිට කම්කරු මහලේකම් කාර්යාලයේ, නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාල භාර, සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු ය.

මෙය යුක්තිසහගත හා සාධාරණ ප්‍රදානයක් බව නිගමනය කරමි.

එන්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2014 මැයි මස 07 වැනි දින.

08-75

---

*මගේ අංකය* : IR/15/16/2010.

**කාර්මික ආරවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.03 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ කඩවත, ගල්දොර පාර, රොක්ලන්ඩ් අංක 189හි පදිංචි කේ. ඩී. තිලකරත්න මයා සහ කොළ 07, ග්‍රෙගරි මාවත, අංක සී 82හි පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3383 දරන ප්‍රදානය 2013.06.14 දිනැති හා අංක 1814/68 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2014.06.02 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
*වැ. බ. කම්කරු කොමසාරිස්.*

2014 ජුනි මස 26 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*මගේ අංකය* : IR/15/16/2010.

කාර්මික අධිකරණයේ දී ය

කේ. ඩී. තිලකරත්න,
අංක 189, රොක්ලන්ඩ්,
ගල්දොර පාර,
කඩවත

නඩු අංක ඒ-3383

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක සී 82,
ග්‍රෙගරි මාවත,
කොළඹ 07

අතර පවතින කාර්මික ආරවුල් පිළිබඳවයි

1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 4 හා 1968 අංක 39, 1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් වලින් සංශෝධිත ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල ද, 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශ්වකරුවන් අතර පවතින කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.06.03 වැනි දින නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කරන ලදී.

එහි ආරවුල විමසීමකට ලක්කර, ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතාට අධ්‍යක්ෂ (මුදල්) වැඩ බැලීමේ කාල සීමාව සඳහා වැඩ බැලීමේ පරිශ්‍රමිකයක් නොගෙවීමෙන් අසාධාරණයක් සිදු ඇති බවත්, ඒ අනුව එකී ඉල්ලුම්කරුට පරිශ්‍රමිකයක් ලබා ගැනීමට අයිතියක් ඇති බවත් තීරණය කළෙමි. 2013.05.15 වැනි දින දරන මාගේ ප්‍රදානය අංක 1814/68 හා 2013.06.14 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එකී ප්‍රදානය ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තර, එකී ප්‍රදානයේ අඩංගු වී නොමැති බැවින්, එකී ප්‍රදානය පහත සඳහන් ආකාරයට ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය කරමි. ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා පත්කර ඇත්තේ, 2005.05.06 වන දින ය. ඔහු 2007.03.29 දින දක්වා මාස 23ක කාලයක් එම තනතුරේ වැඩ බැලීම සිදු කර ඇත. ඉල්ලුම්කරු ඉල්ලා ඇත්තේ, එකී මාස 23ක කාලය සඳහා රුපියල් පන්දහස බැගින් වැඩ බැලීමේ පරිශ්‍රමිකය ලබා දෙන ලෙස ය. ඒ අනුව රුපියල් 5,000x23 = රු. 115,000ක (එක්ලක්ෂ පහළොස් දහසක) මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ඉල්ලුම්කාර කේ. ඩී. තිලකරත්න මහතාට ගෙවිය යුතු බව තීරණය කරමි. මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් ඇතුළත එම මුදල ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවට මෙයින් නියම කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2014 ජූනි මස 02 වැනි දින.

08-76

මගේ අංකය : IR/15/11/2007.

**කාර්මික ආරවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2009.08.13 දිනැති හා අංක 1614/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2009.08.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බොරලැස්ගමුව, දිවුල්පිටිය, කොළඹ පාර, අංක 277හි පදිංචි ඩබ්. අයි. ගුණවර්ධන හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජායා මාවත, අංක 500හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2014.04.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. .

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
වැ. බ. කම්කරු කොමසාරිස්.

2014 ජූනි මස 26 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

මගේ අංකය : IR/15/11/2007.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

ඩබ්. අයි. ගුණවර්ධන,
අංක 277, කොළඹ පාර,
දිවුල්පිටිය, බොරලැස්ගමුව,

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජායා මාවත,
කොළඹ 10.

නඩු අංක A3294

අතර පවතින කාර්මික ආරවුල පිළිබඳවයි

**තීන්දුව හා ප්‍රදානය**

කම්කරු සබඳතා හා මිනිස් බල ගරු අමාත්‍ය අතාවුද සෙනෙවිරත්න මැතිතුමන්ගේ අංක අයි. ආර්/15/11/2007 හා 2009.08.07 දිනැති දරන ලිපිය මගින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (198/68 අංක 37 දරන කාර්මික ආරවුල විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(I) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. දනන්සූරිය වන මා පත් කරන ලදී.

2. මෙම ආරවුලට අදාලව කම්කරු කොමසාරිස් විසින් නිකුත් කරන ලද අයි/15/11/2007 හා 2009.07.03 දින දරන ලිපිය මගින් දක්වා ඇති ඉහත කී කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

   අ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ ඩබ්. අයි. ගුණවර්ධන මහතා හට 2000.01.01 දින සිට ඔහු සේවයෙන් විශ්‍රාම ලැබූ 2004.05.07 දින දක්වා වූ කාල සීමාව සඳහා ඔහු විසින් සිය තනතුරට අදාල වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටීමේ හේතුව මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2003 පරිදි හිඟ වැටුප් වර්ධන සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා එලෙස හිමිකම් ලබන්නේ නම් කුමන ප්‍රමානයක මුදලක් විය යුතු ද යන්න හා

   ආ. ඩබ්. අයි. ගුණවර්ධන මහතාගේ සේවා කාලය සම්බන්ධයෙන් එම අධිකාරිය වෙතින් ලැබිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ යනුවෙන් දක්වා ඇත.

3. මෙම නඩුවේ පාර්ශවකරුවන් විසින් පළමුවන සහ දෙවන ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු බේරුම්කරණය විසින් මෙම කාර්මික ආරවුල් සමථයකට පත්කිරීම සඳහා උත්සාහ කළ ද එවැනි සමථයක් දෙපාර්ශ්වය අතර ඇති කිරීමට නොහැකි වූයෙන් නඩුව විභාගයට ගැනීමට සිදු විය.

4. මෙම නඩුවේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම් ලබාදීම වගඋත්තරකාර අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරන ලදින් ඉල්ලුම්කාර පාර්ශ්වයට නඩුව ආරම්භ කිරීමට නියෝග කරන ලදුව ඉල්ලුම්කරු විසින් නඩුව ආරම්භ කරමින් ඉල්ලුම්කරු පමණක් සාක්ෂි දෙමින් නඩු විභාගයේ දී "ඉ1" සිට "ඉ40" දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. අනතුරුව වගඋත්තරකාර අධිකාරිය විසින් තම නඩුව ආරම්භ කරමින් වගඋත්තරකාර අධිකාරියේ පරිපාලන නිලධාරිනි එච්. ඒ. අනුලාවතී මහත්මිය පමණක් සාක්ෂි දුන් අතර නඩු විභාගයේ දී "ආර්1'' සිට "ආර්17" දක්වා වූ ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

6. අනතුරුව ලකුණු කළ ලේඛන සමග තම ලිඛිත දේශන බේරුම්කරණය වෙත ගොනු කරන ලෙස දෙපාර්ශ්වයට ම බේරුම්කරණය විසින් නියම කරන ලදුව ඉහත කී ලේඛන සමග තම ලිඛිත දේශන දෙපාර්ශ්වය විසින් ගොනු කරන ලදී.

7. බේරුම්කරණය විසින් දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ ලිඛිත දේශනවල යම් යම් ගැටලු විසඳීම සඳහා යලිත් දෙපාර්ශ්වය බේරුම්කරණය හමුවට කැඳවන ලද අතර ඉන් අනතුරුව ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් 2013.11.18 දාතමින් ද, වගඋත්තරකාර පාර්ශ්වය ද එකී 2013.11.18 දාතමින් ද තම වැඩිදුර ලිඛිත දේශන බේරුම්කරණය වෙත ගොනු කර ඇත.

8. මේ අනුව බේරුම්කරණය විසින් විසඳිය යුතු ප්‍රශ්න වන්නේ ඉහත කී කම්කරු කොමසාරිස්ගේ 2009.07.03 දින දරන යොමුවේ දක්වා ඇති පරිදි මෙම කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වන

   අ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ ඩබ්. අයි. ගුණවර්ධන මහතා හට 2000.01.01 දින සිට ඔහු සේවයෙන් විශ්‍රාම ලැබූ 2004.05.07 දින දක්වා කාලසීමාව සඳහා ඔහු විසින් සිය තනතුරට අදාළ වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටීම හේතුව මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2003 පරිදි හිඟ වැටුප් වර්ධක සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා එලෙස හිමිකම් ලබන්නේ නම් කුමන ප්‍රමාණයක මුදලක් විය යුතු ද යන්න හා

   ආ. ඩබ්. අයි. ගුණවර්ධන මහතාගේ සේවා කාලය සම්බන්ධයෙන් එම අධිකාරිය වෙතින් ලැබිය යුතු වෙනත් සහනයක් මොනවාද පිළිබඳව යන්න වේ.

9. ඉල්ලුම්කරු විසින් බේරුම්කරණය වෙත ගොනු කර ඇති ඔහුගේ 2009.08.24 දින දරන පළමු ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත. එනම්,

   i. ඉල්ලුම්කරු මහවැලි සංවර්ධන මණ්ඩලයේ සේවයට 1971 වර්ෂයේ සේවයට බැඳී වසර 33කට අධික කාලයක් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ තුළ සේවය කොට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විධායක අධ්‍යක්ෂ (සංවර්ධන) ලෙස වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමෙන් පසුව එක් වසරක සේවා දිගුවක් ලබා 2004.05.07 දින විශ්‍රාම ලැබූ බවත්, තමන් හට මහවැලි අධිකාරිය විසින් ගෙවිය යුතු උපරිමයේ රැඳී සිටීමේ වාසිය සහ වෙනත් දීමනා නිසි පරිදි නොගෙවීම මෙම ආරවුලට මූලිකවම හේතු වී ඇති බවත්, තමන් විශ්‍රාම ගැනීමේ දී උපරිමයේ රැඳී සිටීමේ වාසිය මත තමන්ට රු. 38,899.20ට වැටුප මත පාරිතෝෂිකය 10%ක අධිභාරයක් ද සහිතව 2007 ජූලි 25 වැනි දින අධිකාරිය විසින් ගෙවූ බවත් දක්වා ඇත.

   ii. එසේම ඔහුගේ ඉහත කී පළමු ප්‍රකාශය මගින්,

      අ. තමන්ට 1994.05.01 දින සිට කළමණාකාර (ප්‍රජා සේවා) තනතුරට උසස්වීමක් හා

      ආ. 2002.01.01 දින සිට විධායක අධ්‍යක්ෂක (සංවර්ධන) තනතුරට උසස්වීමක් ද,

      ඇ. 2003.05.07 දින සිට අධ්‍යක්ෂ ජනරාල්ගේ යෝජනාව හා කැබිනට් අනුමැතිය මත එක් වසරක සේවා දිගුවක් ද ලබා දුන් බවත්,

      ඈ. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය මත තමන්ට වසරක සේවා දිගුවක් ලැබුණත් 2003.05.07 දිනට තමන්ගේ වැටුප් ලෙස තමන්ට ලැබිය

යුතු රු. 38,899.20ක වැටුප තමන්ට නොගෙවූ බවත්, තමන් එම කාලය තුළ ගෙවන ලද්දේ ද රු. 30,820ක මුදලක් බවත්,

ඉ. ඒ අනුව හිඟ වැටුප් හා රැඳී සිටීමේ වාසි ඇතුළු දීමනා ලබදෙන ලෙස 2004.07.30 දින කම්කරු කොමසාරිස්ට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව කම්කරු කොමසාරිස් විසින් කරන ලද පරීක්ෂණවලින් පසුව ඔහුගේ අංක 10/CC/D/215/04 හා 2006.05.05 දින දරන ලිපියෙන් තමන්ට හිමි හිඟ වැටුප් හා දීමනා ගෙවන ලෙසට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් නියෝග කළ බවත්, එපරිදි වැටුප් ගණනය නොවූ බවත්, එකී මුදල් තැන්පත් කළ යුතු බවට හා එසේ තැන්පත් නොකරන්නේ නම් එම මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගන්නා බවත් දැනුම් දුන් නමුත් එම කරුණු ඉටු නොවූ බවත්,

ඊ. මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුව සමග පැවැත්වූ අවසාන සාකච්ඡාවේ දී 2003/06 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව හිඟ වැටුප් ලබා ගැනීමට අයිතිය ඇති බවට මහවැලි අධිකාරියට දැන්වූ බවත්, එහෙත් එම මුදල් ද නොගෙවූ බවත්,

උ. 2004.01.01 දින සිට රජයේ අයවැය ලේඛනය මගින් විශ්‍රාමිකයන් ඇතුළු සියලු රජයේ සේවකයින්ට 10%ක වැටුප් වැඩිවීමක් ලබාදුන් අතර එම දීමනා ලබා දෙන ලෙසට තමන් මහවැලි අධිකාරියෙන් ඉල්ලා සිටි නමුත් එකී 10% වැටුප් වැඩිවීම ද ගෙවීම මහවැලි අධිකාරිය විසින් ගෙවීම පැහැර හරින ලද බවත්,

ඌ. 2006.05.05 වැනි දින යලිත් කම්කරු දෙපාර්තමේන්තුවේ දී පරීක්ෂණයක් පැවති බවත් එහිදී තමන්ට ඇති හිමිකම් පිළිබඳව අවධාරණය කළ නමුත් සාධාරණ විසඳුමක් නොලැබුන බවත්, කම්කරු කොමසාරිස් විසින් යළි නියෝග කොට ලිපියක් යැවුව ද පසු කාලීන චක්‍රලේඛයක් හා අදාල නොවන ආයතන උපදෙස් මත තමන්ට හිමි වැටුප් හා උපරිමයේ රැඳී සිටීමේ වාසි ලබා නොදීමට මහවැලි අධිකාරිය කටයුතු කළ බැවින් තමන් යලිත් කම්කරු කොමසාරිස් වෙත දැන්වූ බවත්,

එ. මහවැලි අධිකාරිය විසින් තම අංක MA/ADM/PF/329 හා 2008.05.22 දින අංක ලිපිය මගින් රැඳී සිටීමේ වාසිය ලබාදීම අනුව හිඟ මුදල් ගෙවීම යන ලිපියෙන් 2004.01.01 දින සිට 2004.05.07 වන දින දක්වා මාස හතරකුත් දින හයක් හා හිඟ මුදල් වශයෙන් රු. 33,341.72ක මුදලක් 2008.06.16 දාතමින් යුත් චෙක්පතක් මගින් තමන් වෙත නිකුත් කළ බවත්, එය සේවක අර්ථ සාධක 12% සේවක භාර නියුක්ත 3% ආදිය නොමැතිව බවත් එකී මුදල මා හට හිමි හිඟ වැටුප් නොවන බවට ලිඛිතව මාගේ විරෝධය පාමින් හිඟ මුදල්වල කොටසක් බවට සටහන් කොට එකී මුදල භාර ගෙන කම්කරු කොමසාරිස් වෙත දැන්වූ බවත්,

10. තමන් 2008.08.02 දාතමින් තමන්ට හිමි රැඳී සිටීමේ වාසිය ලබා නොදීම ඇතුළු තමන්ට හිමිකම් පිළිබඳව යලිත් කම්කරු කොමසාරිස් (කා. ස.) වෙත දැනුම් දුන් බවත් එකී කරුණු කෙටියෙන් මෙසේ බව දක්වා ඇත.

අ. රැඳී සිටීමේ වාසිය පිළිබඳ රා. පරි. ච. ලේ. අංක 11/92 හා 1992.03.03 දින දරන චක්‍රලේඛයේ ඇතුළත් බවත්, එකී චක්‍රලේඛයේ පළමු ඡේදයෙන් දැක්වෙන්නේ රැඳී සිටීමේ වාසිය ලබා දීමට රජය තීරණය කර ඇති බවය යන්න බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2003 චක්‍රලේඛයේ ද අදාල තීරණ රජය විසින් ගත් බවත්,

ආ. අංක 7/2003 චක්‍රලේඛයේ අදාල කරුණ පිළිබඳ රජයේ නව පිළිවෙත දැක්වෙන බවත්, එම රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් කිසි ලෙසකින් හෝ අදාල ගෙවීම් 2004 වර්ෂයට පසු කාලයට පමණක් සීමා කර නැති බවත්,

ඇ. ශ්‍රී ලංකාවේ අර්ථ නිරූපන ආඥාපනතේ 17(1)ඒ වගන්තිය යටතේ යම් නීතියක් වෙනස් කළ යුතු ආකාරය දක්වා ඇති බවත්, යම් නීතියක් ඕනෑම විටක සංශෝධනය කළ හැක්කේ වෙනස් කළ හැක්කේ පරිච්ඡින්න කළ හැක්කේ හෝ අහෝසි කළ හැක්කේ නීතිය පැවරූ බලධරයා විසින් හා පැවරූ ආකාරයෙන් බවත්,

ඈ. කැබිනට් මණ්ඩලය විසින් පනවල ලද නීතියක් වෙනත් නිලධරයෙකු විසින් වෙනස් කළ නොහැකි බවත්,

ඉ. රැඳී සිටීමේ වාසි 2004.01.01 දින සිට පමණක් ගෙවීමට භාණ්ඩාගාරයේ ලේකම් විසින් ගෙන ඇති තීරණය වලංගුභාවයෙන් තොර එකක් බවත්,

ඊ. රැඳී සිටීමේ වැටුප් වර්ධක සේවකයකු උපයා ගන්නා ඒවා බවත්, එය අහිමි කිරීම අයිතීන් පැහැර ගැනීමක් බවත්, රජය පිරිනමන ලද රැඳී සිටීමේ වාසිය පැහැර ගැනීමක් බවත්, රජය පිරිනමන ලද රැඳී සිටීමේ වාසිය 2004.01.01 දිනෙන් පසු කාලයට සීමා කිරීම භාණ්ඩාගාර ලේකම් ගෙන ඇති තීරණය නොතකා හරින ලෙසත් තමන්ට හිමි රැඳී සිටීමේ වාසි හා වෙනත් දීමනා සේවා දිගුව ලැබීමෙන් පසු නිකුත් කළ චක්‍රලේඛ මගින් තමන්ට ලැබිය යුතු ප්‍රතිලාභ හා හිමිකම් කපා නොහැර යුක්තිය හා සාධාරණය ඉටු කරන ලෙසත් ආයාචනය කර ඇත.

11. ඉහත කී පළමු ප්‍රකාශය මගින් මෙම ඉල්ලුම්කරු වැඩිදුරටත් කරුණු දක්වමින් කම්කරු කොමසාරිස්ගේ නියෝගය පරිදි මහවැලි අධිකාරිය තමන්ට ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා ගැන ගණනය කර නොදුන් බැවින් තමන් සවිස්තර ලෙස ඒවා ගණනය කර කම්කරු කොමසාරිස්ට බාරදුන් බවත් එහි සාරාංශය වූයේ තමන්ට හිඟ වැටුප් ලෙස රු. 401,185.50 සහ සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවා නියුක්ති භාර අරමුදලේ දායක මුදල් ලෙස රු. 60,177.70 වශයෙන් මුළු මුදල් රු. 4,61,363.20ක් ලැබිය යුතු බවත්, ඊට අමතරව දැනට දිගු කාලයක් ගත වී ඇති බවත් ඊට අමතරව දැනට දිගු කාලයක් ගත වී ඇති බැවින් නෛතික පොලිය සහ වෙනත් දීමනා ද තමන්ට හිමිවිය යුතු බවත්, අවසාන වශයෙන් තමන්ට ලැබිය යුතු සාධාරණ හා යුක්ති සහගත හිමිකම් හා ප්‍රතිලාභ මහවැලි අධිකාරියෙන් ලබා දීම අපේක්ෂා කරන බවත්, එසේ කොට සාධාරණය ඉටු කර දෙන ලෙස ආයාචනය කර ඇත.

12. ඉහත සඳහන් ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශය සම්බන්ධයෙන් 2009.11.19 දාතමින් වගඋත්තරකාර මහවැලි අධිකාරිය තම පළමු ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත.

අ. ඩබ්. අයි. ගුණවර්ධන මහතාගේ හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් මෙම ආයතනය විසින් 2000.07.19 දිනැති ලිපියෙන් කරුනු දක්වා ඇති බවත්, එකී ලිපිය අනුව රැඳී සිටීමේ වාසි සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 07/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයෙන් දක්වා ඇත්තේ වැටුප් වර්ධකයේ හිඟ මුදල 2003.01.01 දින සිට ගෙවිය යුතු බව ය.

එහෙත් සංස්ථා මණ්ඩල සඳහා හිඟ මුදල් ගණනය කළ යුත්තේ 2004.01.01 දින සිට බව මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කළ DMC/CM/TEN හා 2004.03.03 දිනැති චක්‍රලේඛයේ දක්වා තිබූ බැවින් ගුණවර්ධන මහතාට 2004.01.01 දින සිට ඔහු විශ්‍රාම යන තෙක් සිටි 2004.05.07 දින දක්වා කාලයට හිඟ වැටුප් ගෙවන ලද බවත්, ඒ අනුව එකි චක්‍රලේඛය මගින් 1997 වර්ෂයේ සිට 2003.12.31 දක්වා කාලයට වැටුප් වර්ධකවල හිඟ මුදලින් ගෙවීමට ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ඔහුට හිමි කාලයට හිඟ වැටුප් හිමි නොවන බව දක්වා ඇත.

ආ. ඉහත කී ප්‍රථම ප්‍රකාශය මගින් වගඋත්තරකාර අධිකාරිය වැඩිදුරටත් කරුණු දක්වමින් ඉල්ලුම්කාර ඩබ්. අයි. ගුණවර්ධන මහතා 1992 වසර වන විට ද තමා ලබමින් සිටි වැටුප් පරිමාණයේ (රු. 10,350/-460x6-525x4=15,210) උපරිමයට පැමිණ නොසිට බැවින් 1996 දක්වා ඔහුට හිමි වැටුප් වර්ධක නියමිත පරිදි ගෙවා ඇති බවත්, 1996.01.01 දින එම වැටුප් ක්‍රමය උපරිමයට පැමිණ ඇති බවත්, රා. පරි. ච. ලේ. 11/92 අනුව 1996.01.01 දින උපරිමයට පැමිණි ඩබ්. අයි. ගුණවර්ධන මහතාට රැඳී සිටීමේ වාසි හිමිවන්නේ වසර 5කට පසු එනම් 2002.01.01 දින බව දක්වා ඇත.

ඇ. 1997 වර්ෂයේ වැටුප් ප්‍රතිශෝධනයට අනුව 1998.01.01දිනට අනුරූපී වැටුප් පරිමාණය වන (රු. 17,680/-6x785-4x895-රු. 25,970) වැටුප් ක්‍රමය හිමි වූ බවත්, ඒ අනුව 1998.01.01 දින රු. 25,970 ක් වන උපරිමය ලබා දී ඇති බවත් දක්වා ඇත.

ඈ. ඉන්පසුව 1997.01.15 වැනි දින නිකුත් කළ අංක 2/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 වගන්තිය අනුව උපරිමයේ රැඳී සිටි වසර දෙකකට පසු ඩබ්. අයි. ගුණවර්ධන මහතාට 1999.01.01 දිනට රැඳී සිටීමේ වාසිය ලෙස එක් වැටුප් වර්ධකයක් ලබා දී රු. 26,865/-ක් වැටුප් වර්ධකය තැබිය යුතු වුවත්, එකී ලේඛනයේ සඳහන් පරිදි ඊළඟ ඉහළ වැටුප් පරිමාණයේ උපරිමය වන රු. 26,800/- ඉක්මවන බැවින් රු. 26,800/-ක වැටුප් මත වැටුප් ගෙවූ බවත් දක්වා ඇත.

ඉ. මෙම වගඋත්තරකාර අධිකාරිය වැඩිදුරටත් කරුණු දක්වමින් ඩබ්. අයි. ගුණවර්ධන මහතාට 1996 දක්වා වැටුප් වර්ධක ලබා දී ඇති බැවින් ඔහුගේ රැඳී සිටීමේ වාසි සම්බන්ධයෙන් අදාල වන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/92 නොව 2/97 බවත්, 2/97 හි 6.1 ඡේදයෙන් 11/92 චක්‍රලේඛය අවලංගු කර ඇති බවත් දක්වා ඇත.

ඊ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 අනුව වැටුප් පරිමාණය උපරිමයට පැමිණී අයට රැඳී සිටීමේ වාසි හිමිවන්නේ උපරිමයට පැමිණ වසර 2ක් ගතවීමෙන් පසුව බැවින් ඒ අනුව ගුණවර්ධන මහතාට 1997, 1998 යන වර්ෂවලට වැටුප් වර්ධක ලබා ගැනීමට ඉඩ නොමැති බවත් දක්වා ඇත.

උ. ගුණවර්ධන මහතා 2002.01.01 දින සිට අධිකාරියේ විධායක අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරට පත්ව ඇති අතර එම තනතුරට හිමි රු. 17,850/-10x895 = 26,800/- වැටුප් ක්‍රමයේ උපරිමය වන රු. 26,800/- පිහිටුවා වැටුප් ගෙවා ඇති බවත් දක්වා ඇත.

ඌ. එසේම ඉල්ලුම්කාර ගුණවර්ධන මහතා විධායක අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරට පත් කිරීමේ දී අදාල නව වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරෙහි තබා ඇති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97 අනුව නව වැටුප් පරිමානයේ උපරිමයේ රැඳී සිටීමේ වාසි හිමිවන්නේ 2005.01.01දින බවත්, එහෙත් ඉල්ලුම්කරු 2003.05.07 දින විශ්‍රාම ලබා ඇති බවත් දක්වා ඇත.

එ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2003 අනුව 2004.01.01 දින හිඟ වැටුප් ගෙවිය යුතු බවට නිකුත් කර තිබූ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවක දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව සියලු දීමනා සහිතව රු. 38,899.20ක වැටුප් තලය මත පිහිටුවා 2004.01.01 දින සිට 2004.05.07

දක්වා හිඟ වැටුප් ද ගෙවා ඇති අතර එකී වැටුප් මත 2004.05.07 දින දක්වා පාරිතෝෂික මුදල් ද ඉල්ලුම්කරුට ගෙවා ඇති බව දක්වා ඇත.

ඊ. වගඋත්තරකාර අධිකාරිය ඉහත කී 2 වන ප්‍රකාශයේ අවසාන ඡේදය මගින් ඉල්ලුම්කරුට 2004.01.01 දින සිට 2004.05.07 දින දක්වා මසකට රු. 38,899.20 ක වැටුප් තලයේ පිහිටුවා සම්පූර්ණ හිඟ වැටුප් ගෙවා ඇති බවත්, මේ අනුව ඉල්ලුම්කරු එකී වැටුප් මත සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් වෙනුවෙන් සේවකයා විසින් ගෙවිය යුතු 8%ක දායක මුදල ඉල්ලුම්කරු වගඋත්තරකාර අධිකාරියේ තැන්පත් කරන්නේ නම් ඊට අදාල අධිකාරියේ දායක මුදල වන 12%ක දායක මුදල සමග සේවක අර්ථ සාධක අරමුදල සඳහා බැර කළ හැකි බව ද දක්වා ඇත.

13. ඉහත කී ප්‍රථම ප්‍රකාශ සම්බන්ධයෙන් ඉල්ලුම්කාර ගුණවර්ධන මහතා 2010.01.12 දාතමින් ප්‍රතිඋත්තර ප්‍රකාශයක් ගොනු කරමින් පහත කරුණු දක්වා ඇත.

අ. ඉහත කී ප්‍රතිඋත්තර ප්‍රකාශය මගින් දක්වා ඇති වැදගත්ම කරුණ වන්නේ ඔහුට හිඟ වැටුප් ලෙස ගෙවා ඇත්තේ රු. 33,341.72ක් බවත් ඔහුට ලැබිය යුතු මුදල් රු. 461,000/- කට අධික බවත්, එබැවින් එයට ලිඛිතව විරෝධය පාමින් තමන්ට ලැබිය යුතු හිඟ මුදල්වල කොටසක් ලෙසට බාරගන්නා බව ලිඛිතව දක්වා බාර ගත් බව දක්වා ඇත.

ආ. ඉහත කී ප්‍රතිඋත්තර ප්‍රකාශයේ 1 වන ඡේදය යටතේ වැඩිදුරටත් කරුණු දක්වමින් තමන්ට ලැබිය යුතු හිඟ වැටුප් ඇතුළු මුළු මුදල වූ රු. 461,363.20න් කොටසක් පමණක් ඉහත කී මුදල බව දක්වා ඇත.

ඇ. ඉහත කී ප්‍රතිඋත්තර ප්‍රකාශයේ 2 වන ඡේදය මගින් කාර්මික ආරවුලට හේතු වූ කරුණු පිළිබඳව ප්‍රථම ප්‍රකාශය විස්තර කර ඇති ආකාරය ව්‍යාකුල බවත්, කරුණු පරස්පර විරෝධී බවත්, 7 වන ඡේදයෙහි සඳහන් තම ලිපියට 2002.02.08 වන දින පිළිතුරු යවා ඇති බව පිළිගන්නා ඉල්ලුම්කරු ඒ අනුව රැඳී සිටීමේ වාසිය ලැබෙන බව දන්වා ඇතත් මේ වන තෙක් ගෙවා නොමැති බවත් දන්වා ඇත. තවද 1998.01.01 දිනට රුපියල් 25,970/-ක් වන උපරිමය ලබා දී ඇති බව පවසන මහවැලි අධිකාරිය හිඟ මුදල් ගෙවීම යන හිසින් වූ 2008.05.22 දාතමින් වූ ලිපියේ තමන්ට ලැබිය යුතු වැටුප් පියවර ලෙස රු. 27,760ක් දක්වා ඇතත් එය ගෙවා නොමැති බවත් දක්වා ඇත.

ඈ. ඉහත කී ප්‍රතිඋත්තර ප්‍රකාශයේ 3 වන ඡේදය මගින් සියලු දීමනා සහිතව රුපියල් 38,890.20ක වැටුප් මත පිහිටා තමන් හට හිඟ වැටුප් නොගෙවූ බවත්, විශ්‍රාම යාමට නියමිත දිනය වූ 2003.05.07 දිනට ලැබිය යුතු උක්ත වැටුප් පදනම් කරගෙන මහවැලි අධිකාරිය විසින් පාරිතෝෂිත මුදල් ගෙවූ බවත්, එහෙත් සේවා කාලය තුළ කිසිදු මාසයක ඉල්ලුම්කරුට පාරිතෝෂික ගෙවීමට පදනම් කරගත් රු. 38,899.20ක මාසික වැටුප නොගෙවූ බවත් දක්වමින් ඊට අදාලව කම්කරු කොමසාරිස්ගේ අංක IR/15/11/2007 හා 2007.11.06 දින දරන ලිපිය ඇමුණුම 11 වශයෙන් ඉදිරිපත් කරන බවත් දක්වා ඇත.

14. ඉහත කී ඉල්ලුම්කරුගේ ප්‍රතිඋත්තර ප්‍රකාශය සම්බන්ධයෙන් වගඋත්තරකාර මහවැලි අධිකාරිය 2010.01.21 දාතමින සිය දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරමින් තම පළමු ප්‍රකාශයෙන් කරුණු යළිත් තහවුරු කර ඇත. ඒ අනුව ඉල්ලුම්කාර ඩබ්. අයි. ගුණවර්ධන මහතාට 1997.01.01 දින සිට රැඳී සිටීමේ වාසිය සකස් කර විශ්‍රාම ගැන්වූ දිනට නියමිත වැටුප් පියවර ලෙස රු. 34,270/-ක් වශයෙන් හා ජීවන වියදම් දීමනා ඇතුළත්ව රු. 38,899.20ක් වශයෙන් වැටුප් පියවර ගෙන ඇති බව දක්වා ඇත. එසේම ඉල්ලුම්කාර ගුණවර්ධන මහතා 2003.05.07 වැනි දින සිට විශ්‍රාම ගැන්වූ නිලධාරියකු බැවින් 2004.01.01 දින සිට ක්‍රියාත්මක රා. පරි. ච. ලේ. 2/2003 නිකුත් කරන ලද කළමනාකරණ සේවා චක්‍රලේඛ 21 අනුව වැටුප් වැඩිවීම් ලබාගැනීමට හිමිකමක් නොමැති බවත් දක්වා ඇත. කෙසේ වුව ද ඔහුට අවසානවරට ගෙවන ලද මූලික වැටුප රු. 26,800/-ක් බව ද එකී දෙවන ප්‍රකාශයේ දක්වා ඇත.

15. මෙම නඩුවේ දී දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ පළමු හා දෙවන ප්‍රකාශත් වාචික සාක්ෂිත් ලකුණු කළ ලේඛනයක් සැලකිල්ලට ගනිමින් මෙම ආරවුලට හේතු වී ඇති සහ කම්කරු කොමසාරිස්ගේ IR/15/11/2007 හා 2007.11.06 දින දරන ලිපිය මගින් දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මෙම බේරුම්කරණය විසින් මෙහි පහත සඳහන් පරිදි තීරණය කරමි.

අ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ ඩබ්. අයි. ගුණවර්ධන මහතාට 2000.01.01 දින සිට ඔහු සේවයෙන් විශ්‍රාම ලැබූ 2004.05.07 වන දින දක්වා වූ කාල සීමාව දක්වා ඔවුන් විසින් සිය තනතුරට අදාල වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටීමේ හේතුව මත ර. පරි. ච. ලේ 7/2003 පරිදි හිඟ වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා එලෙස හිමිකම් ලබන්නේ නම් කුමන ප්‍රමාණයක මුදලක් විය යුතු ද ?

ආ. මෙහි දී බේරුම්කරණය විසින් තීරණය කරනු ලබන්නේ ඉහත කි. රා. පරි. ච. ලේ. 7/2003 පරිදි උපරිමයේ රැඳී සිටීමේ හේතුව මත හිඟ වැටුප් සඳහා මෙම ඉල්ලුම්කරු කිසිදු හිමිකමක් නොලබන බව ය.

ඇ. ඊට හේතුන් වන්නේ,

i. "ආර් 3" ලෙස වගඋත්තකාර මහවැලි අධිකාරිය විසින් ලකුණු කරන ලද ලිපිය මුදල් අමාත්‍යාංශයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් රා. පරි. ච. ලේ.

7/2003 අනුව උපරිමයේ රැඳී සිටීමේ වාසිය ඉල්ලුම්කරුට ගෙවිය යුත්තේ 2004.01.01 දින සිට බවට උපදෙස් දෙන ලද ලිපිය වේ. එය අනුගමනය කිරීමට අර්ධ රාජ්‍ය ආයතනයක් වන වගඋත්තරකාර මහවැලි සංවර්ධන අධිකාරිය බැඳී සිටී, ඊට හේතුව වන්නේ, රජය වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් නියෝග සහ උපදෙස් දෙනු ලබන ආයතනය වන්නේ, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වන බැවිනි. එසේ හෙයින් එකී 'ආර් 3' දරන ලිපිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ ස්ථාවරය මෙම බේරුම්කරණයට පිළිගත නොහැකි වීම

ii. ඉහත කී රා. පරි. ච. ලේ. 7/2003 චක්‍රලේඛනය පරිදි 'ආර් 3' දරන ලිපියෙන් ලද උපදෙස් අනුව 'ආර් 8' මගින් ඉල්පුම්කරු වෙත උපරිමයේ රැඳී සිටීමේ වාසි ලබා දීම සහ එම මුදල ඉල්ලුම්කරු අත්සන් කර භාරගෙන ඇති බැවින් ඉල්ලුම්කරු ප්‍රතිබන්ධනය වී සිටීම.

16. මෙම බේරුම්කරණය විසින් මීලඟට සලකා බැලිය යුත්තේ ඉල්ලුම්කාර ඩබ්. අයි. ගුණවර්ධන මහතාගේ සේවා කාලය සම්බන්ධයෙන් මහවැලි සංවර්ධන අධිකාරිය වෙතින් ලැබිය යුතු වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

අ. මෙම ඉල්ලුම්කරු තම ප්‍රකාශ මගින් ද වාචික සාක්ෂි මගින් ද ලකුණු කළ ලේඛන මගින් ද සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඔහුගේ මුළු සේවා කාලය තුලම මෙන් ලැබූ වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටි වාසි ද අදාල වැටුප් පියවරයන් ද 2004 වර්ෂයේ අයවැය මගින් සියළු රජයේ සේවකයන්ට ලබා දුන් 10% වැටුප් වැඩිවීම ද තමන්ට නොලැබුණු බව සහ එම අසාධාරණකම් නිසා තමන්ට කම්කරු දෙපාර්තමේන්තුවේ සහය පැතීමට සිදු වූ බවත් අවසානයේ මෙම බේරුම්කරණයට යොමු වීමට සිදු වූ බවත් ය.

ආ. ඉහත කී කරුණු සම්බන්ධයෙන් ඉල්ලුම්කාර පක්ෂය විසින් නඩු විභාගයේ දී ලකුණු ඉ1 සිට ඉ40 දක්වා වූ ලේඛනවලින් ඉ2, ඉ3, ඉ4, ඉ5, ඉ6, ඉ7, ඉ8, ඉ9, ඉ10, ඉ11, ඉ16, ඉ17, ඉ18, ඉ19, ඉ20, ඉ21, ඉ22, ඉ23, ඉ26, ඉ27, ඉ28, ඉ29, ඉ30. ඉ31, ඉ32, ඉ34, ඉ35, ඉ36, ඉ36(ඒ), ඉ38, ඉ39, ඉ40 දරන ලේඛන ද වගඋත්තකරු වෙනුවෙන් ලකුණු කළ ආර්7, ආර්13, ආර්14 යන ලේඛන සලකා බැලීම වැදගත් වේ. මෙම ලේඛන සලකුණු කිරීමේ දී ඒ37, ඒ39, ඉ40, දරන ලේඛන හැර ඉතිරි ලේඛන සම්බන්ධයෙන් වගඋත්තරකාර අධිකාරිය විසින් කිසිදු විරුද්ධත්වයක් හෝ ඔප්පු කිරීමේ භාරයක් ඉදිරිපත් නොකළ බැවින් ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කළ එකී ලේඛන නිවැරදි ඒවා බවට බේරුම්කරණය විසින් පිළිගෙන ඇත.

ඇ. මෙම ඉල්ලුම්කරු තම 2012.12.21 දින දරන ලිඛිත සැළකිරීම මගින් ආර්7 මගින් ලකුණු කරන ලද රා. පරි. ච. ලේ. 2/97හි 6.1 ඡේදය පරිදි වැටුප් පරිමාණයේ උපරිමයේ රැඳී සිටින සෑම අවුරුදු 2ක් වෙනුවෙන් ම රැඳී සිටීමේ වාසිය ලැබීමට 1997.01.01 ක්‍රියාත්මක වන පරිදි හිමිකම් ලබන හෙයින් ඉල්ලුම්කරු තමන්ට හිමි වැටුප් පරිමාණයේ අවසානයට හිමි වැටුප් වර්ධකයේ අගය 1999.01.01 දින සිට බැවින් එවකට ඔහු ලැබූ රු. 25,970/-ක වැටුපේ සිට රු. 25,800/- දක්වා ඊ9 ලේඛනය අනුව වැටුප් වැඩි කරන්නේ 2000 අප්‍රේල් මස සිට බැවින් ඉල්ලුම්කරු එකී උපරිමයේ රැඳී සිටීමේ වාසියට හිමිකම් ලබා මාස 15කට පසුව වැටුප් තලයේ පිහිටුවා ඇති බැවින් ඒ මත රු. 13,425/-ක මුදලක් (රු. 895/-x15) වගඋත්තරකාර අධිකාරිය විසින් ඉල්ලුම්කරුට ගෙවීමට පැහැර හැර ඇති බව දක්වා ඇත.

ඇ. මෙම ඉල්ලුම්කරු ඊ3 දරන ලේඛනය මගින් අධිකාරියේ විධායක අධ්‍යක්ෂක තනතුරට (සංවර්ධන) 2002.01.01 දින සිට පත්කර ඇති අතර එකී තනතුරට අදාල වැටුප් පරිමාණය වන රු. 17,850=10x895=26,800/- උපරිම වැටුප් තලයේ පිහිටුවා ඇත.

ඉ. වගඋත්තරකාර අධිකාරිය විසින් සලකුණු කර තිබෙන ආර්13 ලේඛනය පරිදි ඒ03 වැටුප් කාණ්ඩයේ (214,200/- 10x10,740 - 321,600) හි උපරිම මාසික වැටුප වන්නේ රු. 26,800/-කි. එනම් මෙයින් පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු ඒ03 වැටුප් කාණ්ඩයට උසස් කර ඇත්තේ ඉහත සඳහන් විධායක අධ්‍යක්ෂක (සංවර්ධන) තනතුරට පත්කර ඇති 2002.01.01 දින සිට බව ය. එහි සඳහන් වන ආකාරයට ඊට ඉහළින් ඇත වැටුප් කාණ්ඩය වන ඒ02 (217,440/=10x10,740-324,840) හි උපරිම මාසික වැටුප වන්නේ රු. 27,070/-කි. ඉහත සඳහන් ආකාරයට ඒ03 වැටුප් කාණ්ඩයේ උපරිම මාසික වැටුප රු. 27,070/- සිට රු. 29,485/- දක්වා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2004.01.02 දින චක්‍රලේඛ අංක 21 අනුව 2004.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කොට ඇත. එසේ වුවද ඊ18, ඊ19, ඊ20, ඊ21 දරන වැටුප් පත්‍රිකා අනුව 2004 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු යන මාසවල ඉල්ලුම්කරුට මසකට ගෙවා ඇත්තේ රු. 26,800/- කි. එකී මාස 4 සඳහා පමණක් ආර්13 දරන ලේඛනයේ දක්වා ඇති පරිදි මූලික වැටුප වන රු. 29,485/- බැවින් ඉල්ලුම්කරුට වගඋත්තර අධිකාරිය හිඟ වැටුප් වශයෙන් රු. 10,740ක මුදලක් ගෙවීම පැහැර හැර ඇති බව දක්වා ඇත.

ඊ. එසේම ඊ22 අනුව 2004 මැයි මාසයේ දින 7කට අදාල මූලික වැටුප රු. 89.50ක් අඩුවෙන් ගෙවා ඇති බැවින් එකී මුදල ද ඒ සඳහා එකතුව වශයෙන් රු. 10,740+රු. 89.50-10,829.50ක මුදලක් ආර්13 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය අනුව ඉල්ලුම්කරු

වෙත වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවීම පැහැර හැර ඇති බව දක්වා ඇත.

උ. ඊ2 වශයෙන් සලකුණු කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉල්ලුම්කරුගේ සේවය 2003.05.07 දින සිට එක් අවුරුද්දක කාලයකට දීර්ඝ කර ඇත.

ඌ. ඊ23 දරන ලේඛනය අනුව ඉල්ලුම්කරුට වයස 60 සම්පූර්ණ වූ 2003.05.07 දිනට ලැබිය යුතු වැටුප රු. 38,899.20ක් ලෙස දක්වා ඇති ඊ17, ඊ18, ඊ19, ඊ20 සහ ඊ21 දරන වැටුප් පත්‍රිකා අනුව ඉල්ලුම්කරුට මාසික වැටුප වශයෙන් ගෙවා ඇත්තේ රු. 30,680ක් බව ය. ඊ23 ලෙස ලකුණු කර ඇති එකී ලිපිය ඊ2 වශයෙන් ලකුණු කර ඇති අමාත්‍ය මණ්ඩලය තීරණය සමග සසඳා බැලීමෙන් පෙනී යන්නේ වගඋත්තරකාර මහවැලි අධිකාරී විසින් ඉල්ලුම්කරුට 2003.05.07 දින සිට 2004.05.07 දින දක්වා කාලය තුළ ඉහත දක්වා ඇති පරිදි (38,899.20-30,680.00)x13=98,630.40ක් ගෙවීම ද පැහැර හැර ඇති බව ය.

එ. මේ අනුව ලිඛිත සැලකිරීම මගින් පහත සඳහන් මුදල් ඉල්ලුම්කරු විසින් ලබාදෙන ලෙස ආයාචනය කර ඇත.

එය මෙසේ ය.

| | | |
|---|---|---|
| 16 ඇ ඡේදය අනුව වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවීම පැහැර හැර ඇති මුදල | = | රු. 13,425.00 |
| 16ඊ ඡේදය අනුව වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවීම පැහැර හැර ඇති මුදල | = | රු. 10,829.50 |
| 16ඌ ඡේදය අනුව වගඋත්තරකාර අධිකාරිය විසින් ගෙවීම පැහැර හැර ඇති මුදල | = | රු. 98,630.40 |
| **එකතුව** | = | **රු. 122,884.90** |

ඒ. මීට අතිරේකව ඉල්ලුම්කරු විසින් ඊ36 දරන ලේඛනය මගින් රු. 80,880.15ක් ද, ඊ36(ඒ) දරන ලේඛනය මගින් රු. 461,363.20ක මුදලක් ද ලබා දෙන ලෙස ද ආයාචනය කර ඇත.

මෙම නඩුවේ දි ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් සලකුණු කළ ඊ36 සහ ඊ36(ඒ) දරන ලේඛනවලින් ඉල්ලුම්කරුට හිමි මුදල් පිළිබඳව සංඛ්‍යා ඉදිරිපත් කර ඇති අතර එම ලේඛන සඳහා ඔප්පු කිරීමේ භාරයක් හෝ වගඋත්තරකාර අධිකාරිය විසින් ඉල්ලීමක් නොකරමින් භාරගෙන ඇති බැවින් එකී ලේඛනවල සඳහන් මුදල් නිවැරදි බවට බේරුම්කරණයට තීරණය කිරීමට සිදු වේ. එකී ලේඛන ලකුණු කිරීමේදී ඉල්ලුම්කරු මූලික සාක්ෂිවල දී මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර : මහත්මයා ඒ සම්බන්ධව 2008 දී ලිපියක් මගින් දන්වා සිටියා ද ?

උ : 2008.05.12 දාතමින් කම්කරු කොමසාරිස් ජනරාල් අමතා පැමිණිල්ලක් කළා.

ප්‍ර : ඒ අනුව මහත්මයා කිසියම් ලේඛනයක් පිළියෙල කළා ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ලැබිය යුතු මුදල සම්බන්ධව ?

උ : ඔව්, කම්කරු කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් අතර පැවති සාකාච්ඡාවේ දී දැන්වූයේ මට හිඟ වැටුප සකස් කරන්න. ඒ අනුව මා තීරණය කළා මා හට ලැබිය යුතු වැටුප් සහ හිඟ වැටුප පිළිබඳව 1996.01.01 සිට 2004.05.07 දක්වා ලේඛනයක් ලකුණු කළා. එහිදී තවදුරටත් 10% වැටුප් වැඩිවීමක් සම්බන්ධ කර කොටස් දෙකක් සඳහන් කළා. හිඟ වැටුප් ලෙස රු. 461,363.20 සහ 10% වැඩිවීම අනුව මහවැලි අධිකාරිය විසින් මාගේ අවසාන වැටුප ලෙස ගණනය කර ඇති රු. 38,890.20 ලෙස ගෙන මා හට ලැබිය යුතු ගෙවීම් රු. 80,880.15ක් ලෙස පිළියෙල කළා. (සාක්ෂි සටහන් 2011.06.09 දින පිටුව 7)

මෙම සාක්ෂිවල දී ඉහත සඳහන් කළ ලේඛන ඊ36 සහ ඊ36ඒ ලෙස ලකුණු කර ඇත.

ඔ. මෙම ඉල්ලීම් සම්න්ධයෙන් මහවැලි අධිකාරිය වෙතින් යහපත් ප්‍රතිචාරයක් නොලැබීම හේතුකොට ගෙන ඉල්ලුම්කරුට කම්කරු දෙපාර්තමේන්තුවේ සහාය පැතීමට සිදු වී ඇති බව ඊ29, ඊ30 සහ ඊ38 දරන ලේඛන මගින් මනාව පැහැදිලි වේ.

ඕ. කරුණු මෙසේ බැවින් කාර්මික ආරවුලට යොමු වී ඇති ඩබ්. අයි. ගුණවර්ධන මහතාගේ සේවා කාලය සම්බන්ධයෙන් එම අධිකාරිය වෙතින් ලැබිය යුතු වෙනත් සහනයන් ද මොනවාද යන්න පිළිබඳව සලකා බලමින් මෙහි පහත දක්වා ඇති පරිදි අදාල මුදල් ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකම් ඇති බවට තීරණය කරමි.

| | | |
|---|---|---|
| 16 ඇ ඡේදය අනුව | = | රු. 13,425.00 |
| 16ඊ ඡේදය අනුව | = | රු. 10,829.50 |
| 16ඌ ඡේදය අනුව | = | රු. 80,880.15 |
| | = | රු. 461,363.20 |
| **එකතුව** | = | **රු. 566,497.85** |

අඩුකළා :

| | | |
|---|---|---|
| ආර් 8 ලේඛනය අනුව අධිකාරිය විසින් ගෙවන ලද උපරිමයේ රැඳ සිටිමේ වාසි | = | රු. 33,341.72 |
| ගෙවිය යුතු මුදල | = | රු. 533,156.13 |

මේ අනුව ඉහත කී රුපියල් පන්ලක්ෂ තිස් තුන්දහස් එකසිය පනස් හයයි ශත දහතුන (රු. 533,156.13) ක මුදල අද දින සිට මසක් ඇතුළත එනම්, 2014.05.21 දින හෝ ඊට පෙර මැද කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු බවට වගඋත්තරකාර අධිකාරිය වෙත මෙයින් නියෝග කරමි.

එසේ තැන්පත් කිරීමෙන් පසුව එකී මුදල මෙහි ඉල්ලුම්කරුට ලබාගත හැකි බවද වැඩදුරටත් මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදානයක් කොට මම සලකමි.

පී. දනන්සූරිය.
බේරුම්කරු.

2014 අප්‍රේල් මස 21 වැනි දින,
කොළඹ දී ය.

08-77

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.